# නයි මිරිස් පැළය



පී.ඒ. කවීන් ආදිත්‍ය

# නයි මිරිස් පැළය

ජී.ඒ. කවීන් ආදිත්‍ය

**නයි මිරිස් පැළය**

කතෘ ප්‍රකාශනයකි

පළමුවන මුද්‍රණය 2026 මැයි 10

කතාව සහ චිත්‍ර

**ජී.ඒ. කවීන් ආදිත්‍ය**

4 ශ්‍රේණිය A

විද්‍යාර්ථ විද්‍යාලය

මහනුවර

ISBN 978-624-211-048-6

# පිදුම

මා වෙත සෙනෙහසින්

අකුරු ලියවූ

සුභානි බෙන්තරආරච්චි,

චම්පිකා කොඩිකාර

ගුරු මෑණිවරුන්ටත්

මා සෙනෙහසින් හැදූ වැඩූ

අම්මාටත්, අප්පච්චිටත්

ආදරයෙන් පුදමි.





# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධර්ම මෙන්ම නිර්මානාත්මක ප්‍රවර්ධණය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය හා බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනිය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,  
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.  
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.  
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට  නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව,
2026.05.10



# විදුහල්පතිතුමන්ගේ පණිවිඩය

සමබර පෞරුෂයකින් යුතු සුහුරු දරුවන් අනාගත ලෝකයට බිහිකිරීම විද්‍යාර්ථ දැක්මයි.

මෙම දැක්ම සාක්ෂාත් කරනුවස් දරුවන් සඳහා විවිධ අවස්ථා සම්පාදනය කිරීමේ භාරදූර කාර්යය විද්‍යාර්ථ විද්‍යාලය මැනැවින් ඉටුකරමින් පවතී.

තාක්ෂණික ලොව තුළ කොතරම් පහසුකම් තිබුණ ද පතපොත ඇසුරේ ලබනා දැනුම කුඩා සිත් සතන් පෝෂණය කරයි.

මෙවන් කුඩා අවධියක ලේඛන කලාවට පිවිසීමට මේ දරුවා දරණ උත්සාහය සැබැවින්ම අගය කරමි. කුඩා අංකුර ලේඛකයකු වශයෙන් පර්යේෂණාත්මක මුහුණුවරකින් ඉදිරිපත් කරන මෙම දරුවාගේ හැකියාවන් තවදුරටත් වඩා වර්ධනය වේවායි විද්‍යාලයේ සියළුම ප්‍රජාව වෙනුවෙන් සුභාශිංසන එක්කරමි.

විදුහල්පති
විද්‍යාර්ථ විද්‍යාලය
මහනුවර.


## නොවැම්බර් - 13

අද හවස අපේ අම්මා නයිමිරිස් සම්බෝලයක් ගලේ අඹරනවා. මුළු කුස්සියම සුවඳයි. මම අම්මාගෙන් ඇහුවා නයිමිරිස් හැදෙන්නේ කොහොමද? කියලා.










## නොවැම්බර් - 13

අම්මා මට රතුපාට නයිමිරිස් කරලක් අතට දුන්නා. ඒක කපලා ඇතුල බලන්න කියලා. පිහිය අරගෙන හෙමිහිට කරල දෙකට කැපුවා. හරි පුදුමයි...... ඇතුලේ තද කහ පාට ඇට ගොඩක් තියෙනවා.

හා ...... හා...... නිකම්ම ගලවන්න එපා.... නයිමිරිස් ඇට ගෑවුනොත් අත දැවිල්ල ගනියි" අත්තම්මා කිව්වා.

මම දුවගෙන ගිහින් පරණ අත් ග්ලවුසයක් දාගෙන ආවා. කඩදාසි කොළයක් අරගෙන ඇට ටික හෙමින් හෙමින් කොළය උඩට ගලවලා ගත්තා.





# නොවැම්බර් - 14

ඇට ටික පැල කරන්න ආසා හිතුණු නිසා උදෙන්ම දුවගෙන ගිහින් බඳුනක් අරගෙන ආවා.





## නොවැම්බර් - 14


**කොම්පෝස්ට් බින් එකෙන් ගත්තු පොහොරයි, පසුයි කලවම් කරලා පස් මිශ්‍රණය හදා ගත්තා. ඒවා බඳුනට දැම්මා. තීන්ත ඉවර වුණු පෑන් බටයකින් වලවල් හදා ගන්න අම්මා මට උදව් කළා. එක වලකට ඇට දෙක ගානේ දාලා ඒවා පස් ටිකකින් වැහුවා.**



# නොවැම්බර් - 14 සිට 21 දක්වා

## ඇට ටිකක් උඩට ඉස්සිලා. ඒකෙන් පොඩි මොටයියෙකුත් ඇවිල්ලා. 








## නොවැම්බර් - 21 සිට 30 දක්වා

ටික දවසකට පස්සේ මොටයියෙක් ඇවිත් තිබූ නයි මිරිස් ඇටය තල්ලු කරගෙන පොඩි පැළයක් උඩට ඇවිත් තියෙනවා.





# දෙසැම්බර් - 3

## බඳුනෙන් පැළය ගලවලා පස්, කොම්පෝස්ට් දැමූ මල් පෝච්චියේ ඒ පැළය පැළ කලා.










## දෙසැම්බර් - 5

# උදේ හවස දිනපතා වතුර දාලා පැළය බලා ගත්තා.



## දෙසැම්බර් - 23


# කෘමි සතුන්ගෙන් පැළය ආරක්ෂා කර ගැනීමට කොහොඹ තෙල් ඉස්සා.





## ජනවාරි - 5

**පොඩිවට තිබුණු පැළේ ටිකෙන් ටික ලොකු වෙලා . මට හරි සතුටුයි. ලස්සන මලකුත් ඇවිල්ලා තියෙනවා මම දැක්කා.**





## ජනවාරි - 16

# අද නයි මිරිස් මලෙන් පොඩි ගැටයක් ඇවිත් තියෙනවා දැක්කා.






# ජනවාරි - 30

හරිම සතුටුයි  මගේ පැලේ නයි මිරිස් කරල් ඇවිත්. දුවගෙන ගිහින් ඒ ගැන අම්මටයි, අත්තම්මටයි කිව්වා. එයාලටත් සතුටුයි.

"ඔයා පැලේ ආදරයෙන් බලා ගත්තා" කියමින් අම්මා මගේ ඔළුව ආදරයෙන් අත ගෑවා......











# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධණය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා සංවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමෙතුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)